# ගසක මහිම

## දහසක් මල්

පුදුම නොවන්න ! — වසර 50 ක් වයස් වූ ගසකින් එම වකවානුව ඇතුළත මනුෂ්‍ය වර්ගයා උදෙසා ඉටුවූ මාහැඟි සේවාවෙහි අගය රුපියල් වලින් මැන්නොත් රුපයල් 15 ලක්ෂ 70 දහකි. ඒ මෙසේය: පරිසර දූෂණය වැළැක්වීම පිණිස ඉටුවූ මෙහෙයෙහි වටිනාකම රු: 5,00,000 කි. වර්ෂා පතනය හා තෙතමනය රඳවා තබා ගැනීමද පිණිස ඉටුවූ මෙහෙයෙහි වටිනාකම රු: 3,00,000 කි. නිපදවන ලද අම්ලකර (ඔක්සිජන්) ප්‍රමාණයෙහි වටිනාකම රු: 2,50,000 කි.

සෝද පාළුව මැඩීම හා පස සරුසාර කිරීමද පිණිස ඉටුවූ මෙහෙයෙහි වටිනාකම රු: 2,50,000 කි. පක්ෂීන් හා අනෙකුත් සතුන්ගේ ද රැකවරණය පිණිස ඉටුවූ මෙහෙයෙහි වටිනාකම රු: 2,50,000 කි. මාංශ ජනක ධාතූන් පිළියෙළ කිරීම පිණිස ඉටුවූ මෙහෙයෙහි වටිනාකම රු: 20,000 කි. (එම ගහෙන් ලැබෙන ගෙඩි ආදියෙහි හා දැවවලද වටිනාකම මීට ඇතුළත් නොවේ.)

විශාල ලෙස වැඩුණු ගසක වාණිජමය වටිනාකම අද පවත්නා මිල ගණන් අනුව රු: 5,000 ක් පමණ වෙයි. එහෙත්, එම ගසින් අවුරුදු 50 ක් තුළදී ඉටුවූ සේවසේ වටිනාකම හා සමග සසඳන කල එය අංශු මාත්‍රයෙකි.

සාමාන්‍ය වෘක්ෂයක වයස අවුරුදු 100, වත් 200 වත් අතර කාලයෙකි. අවුරුදු 400 වත් 500 වත් අතර කාලයක් පවත්නා වෘක්ෂ ද ඇත. රත්හඳුන් ගසකට අවුරුදු 2,000 වත්, 3,000 වත් අතර කාලයක් නොනැසී පැවැතිය හැකිය.

## දැව කපන්නකු අමතා ගසක් කතා කරමින්:

"පිය මිතුර, මා වෙත සමීප නොවන්න. ඔය ඔබ අත ඇත්තේ කිමෙක් ද? අහා, පොරොවෙකි! එය දකිනා විටත් මගේ සිරුර වෙවුලා යෙයි. ඇයි, ඔබ මා තළා පෙළා මට වද වේදනා දෙන්න මෙහි ආවේ? මා ඔබට වරදක් කෙළෙම් ද? කුරා කුහුඹියකුටවත් වරදක් නොකරන මට තනි පංගලමේ නිදහසේ ජීවත් වෙන්න ඉඩ නොහරින්නේ ඇයි? බලන්න, මා ඔබේ සිරුරෙහි දහය නිවාලන සිහිලක් මා ළඟ නැද්ද?

ඔබ මා විනාශ කර දමුවහොත්—

"ඔබට වැසි ලබාදෙන වළාකුළු නැතිවියාවි!"

"වැසි නැතිව යාමෙන් (ඔබේ කුස ගිනි නිවා ගැනීමට) යමක් වවාගන්න බැරිව යාමි!!!"

"ඔබට අඩු තරමින් පිපාසය නිවා ගැනීමට හෝ දිය පොදක් නැතිව යාවි!!!!"

"අවසානයේ දී, ඔබ මරු කතරක තනි වේවි!!!!!

"මම ඔබට මේ මොහොතේ දී බුදු වදනක්ද මතක් කරදෙනු කැමැත්තෙමි. කරුණාකර ඊට සවන් යොමනු මැනව.

"තමන්ගේ පැවැත්ම ගැන අන් කිසිවකු කෙරෙහි කිසිම බලාපොරොත්තුවක් නොතබමින් තමන්ගේ ජීවන ක්‍රියාවලියෙහි සියලුම නිපැයුම් අපරිමිත සැදැහැයකින් යුතුව (මිනිසුන් හා වෙනත් සත්වයින්ද ඇතුලු) අන් අයට බෙදහද දෙන වන පෙත අපරිමිත දයානුකම්පාවෙන් හා ත්‍යාගශීලී බවකින්ද යුතු සජීවී වස්තුවෙකි. එය සකල ලෝක සත්ත්වයා කෙරෙහි රැකවරණය පිරිනමයි, තමන් වැනසීමට එන රුක්කපන්නාට පවා සෙවන සලසයි"